ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

කෘෂි විද්‍යාව - I පත්‍රය

2 වාර පරීක්ෂණය

13 ශ්‍රේණිය කාලය පැය -2

01) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහතින් දැක්වේ.

A – කෘෂිකාර්මික පර්යේෂණ මෙහෙයවීම

B – බෝග කලාපීකරණය

C – කෘෂිකාර්මික ශිෂ්‍යත්ව පිරිනැමීම

D – සහතික කළ බීජ නිෂ්පාදනය හා බීජ සහතික කිරීම

ඉහත ප්‍රකාශ අතරින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවාවන් වන්නේ,

1. A පමණි
2. A, C හා D ය
3. A, B හා D ය
4. A, B හා C ය
5. ඉහත සියල්ලම

02) උද්‍යාන බෝග, ක්ෂේත්‍ර බෝග හා කුරුඳු සඳහා වූ පර්යේෂණ ආයතන ස්ථාපිත කර ඇති ප්‍රදේශ වන්නේ පිළිවෙලින්,

1. බතලගොඩ, කඹුරුපිටිය හා ගන්නොරුව වේ.
2. ගන්නොරුව, මහඉලුප්පල්ලම හා කඹුරුපිටිය වේ.
3. උඩවලව, ලුණුවිල හා බණ්ඩාරවෙල වේ.
4. බතලගොඩ, මහඉලුප්පල්ලම හා උඩවලව වේ.
5. ගන්නොරුව, උඩවලව හා මහඉලුප්පල්ලම වේ.

03) අන්තර් නිවර්තන අභිසාරී තලාපය දකුණට විස්තාපනය වනුයේ,

1. නිරිතදිග මෝසම් කාලවලදීය.
2. ඊසානදිග මෝසම් කාලයටය.
3. සියලුම වර්ෂා කාලවලදීය.
4. සියලුම වියළි කාලවලදීය.
5. අන්තර් මෝසම් කාලවලදීය.

04) උතුරු නැගෙනහිර හා වයඹ පළාතේ වෙරළාසන්න ප්‍රදේශවල තීරුවක් ලෙෂ ව්‍යාප්තව ඇත්තේ,

1. දියළු පසය
2. රතු කහ ලැටසෝල් පසය
3. රතු දුඹුරු පසය
4. චූර්ණමය නොවන දුඹුරු පසය
5. අපරිනත පසය

05) පසක ඇති ජලාකර්ශක ජලය යනු,

1. ශාකයට ලබා ගත හැකි ජලය කොටසකි.
2. ශාකයට ලබා ගත නොහැකි ජලය කොටසකි.
3. පසෙහි ඇති අතිරික්ත ජලයයි.
4. ක්ෂේත්‍ර ධාරිතා අවස්ථාවේ පසේ ඇති ජලයයි.
5. සංතෘප්ත අවස්ථාවේ පසේ ඇති ජලයයි.

06) කාබනික ද්‍රව්‍ය පසට යෙදීම නිසා පසෙහි,

1. සත්‍ය ඝනත්වය වැඩිවේ.
2. වයනය දියුණු වේ.
3. දෘෂ්‍ය ඝනත්වය අඩු වේ.
4. සච්ඡිද්‍රතාව අඩු වේ.
5. ජලය රඳවා ගැනීම අඩුවේ.

07) ශෂ්‍ය විද්‍යාත්මක පාංශු සංරක්ෂණ ක්‍රමයකි,

1. සමෝච්ච රේඛා අනුව කාණු කැපීම.
2. ආවරණ බෝග වගාව.
3. හෙල්මළු යෙදීම.
4. සමෝච්ච ආකාරයට බිම් සැකසීම.
5. SALT

08) කෘෂි කාලගුණික මධ්‍යස්ථානයක කාලගුණික දත්ත ලබා ගැනීම පිළිබඳව නිවැරදි වනුයේ,

A. කාලගුණික මධ්‍යස්ථානයක දත්ත ලබා ගැනීමේ සම්මත වේලාව වනුයේ පැය 8.30 හා පැය 15.30 වේ.

B. වර්ෂාපතනය, උපරිම හා අවම උෂ්ණත්වමාන පාඨාංක ලබාගනුයේ පැය 8.30 හා පැය 15.30 දීය.

C. තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමාන පාඨාංක හා පාංශු උෂ්ණත්වමාන පාඨාංක දවසට දෙවරක් ලබාගනී.

1. A පමණි
2. B පමණි
3. A හා C පමණි
4. A හා B පමණි
5. A, B හා C සියල්ලම

09) බෝග වගාව සම්බන්ධව බලපාන කාලගුණික සිධක නිවැරදිව දක්වා ඇත්තේ කුමන පිළිතුරෙහිද?

1. කැරට් වල තැඹිලි වර්ණය සංස්ලේෂණයට වැඩි දිවා උෂ්ණත්වයක් අවශ්‍ය වේ.
2. දඩු කැබලි මුල් ඇදීම අඩු සාපේක්ෂ ආර්ද්‍රතාවයක් වැඩි උෂ්ණත්වයක් යටතේ සිදුවේ.
3. අර්තාපල් ආකන්ද ඇතිවීම සඳහා රාත්‍රී උෂ්ණත්වය 10°C – 15 °C හා දිවා කාලයේ 27°C ක උෂ්ණත්වයක් තිබිය යුතුය.
4. සාපේක්ෂ ආර්ද්‍රතාව අඩු වූ විට තේ බිබිලි රෝග ආසාදනය වැඩිවේ.
5. කෝපි ශාකයේ මල් පිපෙනුයේ දිගු දිවා කාල සහිත මාසවලය.

10) එක්තරා ශාකයක ශාක පත්‍ර වල වර්ණය මලානික කොළ පැහැයට පත්වී ඉන්පසු පරිනත පත්‍ර කහ වී වර්ධනය බාල විය. මෙයට හේතුව වනුයේ,

1. Mg ඌණතාවයට ගොදුරුවීම.
2. B ඌණතාවයට ගොදුරුවීම.
3. දිලීර රෝගයක් වැළඳීමය.
4. N ඌණතාවයට ගොදුරුවීම.
5. ජලවහනය දුර්වලවීම නිසා ඇති වූ ප්‍රශ්නයකි.

11) ශාක පෝෂකසම්බන්ධ නිවැරදි ප්‍රකාශය වනුයේ,

1. චල මූලද්‍රව්‍යවල ඌණතා ලක්ෂණ පෙන්වනුයේ ශාකයේ අග්‍රස්ථයේය.
2. Ca හා B අචල මූලද්‍රව්‍ය වේ.
3. Na ශාක වල නිරෝගී වර්ධනයට අත්‍යාවශ්‍ය වේ.
4. Mn ශාකයේ වියළි බරින් 0.1% වඩා වැඩියෙන් අවශ්‍ය වේ.
5. M,P,K හා S ප්‍රාථමික මූලද්‍රව්‍ය වේ.

12) කුඹුරකට යූරියා 200kg එක් කිරීමෙන්පසට එක් කළ හැකි N ප්‍රමාණය වනුයේ,

1. 46kg 2. 92 kg 3. 60 kg 4. 100 kg 5. 200kg

13) අනිසි පොහොර භාවිතයේ අහිතකර බලපෑමක් නොවනුයේ,

1. විෂ රසායන ද්‍රව්‍ය පසෙහි එක්රැස් වීම.
2. පාංශු ජීවී ගහනය අඩුවීම.
3. පස ආම්ලික වීම.
4. කාබනික ද්‍රව්‍ය වියෝජනය වේගවත් වීම.
5. ජලාශ සුපෝෂණය වීම.

14) පහත දැක්වෙනුයේ බිම් සැකසීම සම්බන්ධව ප්‍රකාශ කිහිපයකි.

A. පසට පොහොර මිශ්‍ර කිරීම අතුරුයත් ගෑමට අයත් ක්‍රියාවකි.

B. ශූන්‍ය බිම් සැකසූ ක්ෂේත්‍රයක බීජ ප්‍රරෝහණය වීම වැඩිය.

C. ගැමි ලී නගුල පැරණි තාක්ෂණය යටතේ යොදාගත් කාර්යක්ෂමතාව අඩු උපකරණයක් වුවත් එමඟින් පස් පිඩැලි හොඳින් පෙරලේ.

සත්‍ය ප්‍රකාශ වනුයේ,

1. A පමණි 2. B පමණි 3. B හා C පමණි 4. A හා C පමණි

5. A, B හා C සියල්ලම

15) කොකු නගුල යනු,

1. සත්ත්ව ශ්‍රමයෙන් භාවිත කරන ද්විතියික බිම් සැකසීමේ උපකරණයකි.
2. මිනිස් ශ්‍රමයෙන් ක්‍රියා කරන ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණයකි.
3. මිනිස් ශ්‍රමයෙන් ක්‍රියා කරන ද්විතියික බිම් සැකසීමේ උපකරණයකි.
4. යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරන ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණයකි.
5. යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරන ද්විතියික බිම් සැකසීමේ උපකරණයකි.

16) තවානක් පිළිස්සීම මගින් ජීවානුහරණය කිරීමේදී,

1. තවානට පිදුරු යෙදීම සිදු කරයි.
2. තවානට ලී කුඩු යෙදීම වඩාත් උචිතය.
3. සුළඟේ දිශාවට ගිනි තැබීම සිදු කළයුතුය.
4. පිළිස්සීමට පෙර දිලීර නාශක යෙදිය යුතුය.
5. ඉතා ඉක්මණින් පුළුස්සා අවසන් කළ යුතුය.

17) වැල් දොඩම්, රටකජු හා ඞෑණු වගාවට වඩාත් සුදුසු ජල සම්පාදන ක්‍රම පිළිවෙලින් දැක්වෙනුයේ,

1. බිංදු, විසිරි හා බේසම්
2. බිංදු, විසිරි හා ඇළි වැටි
3. විසිරි, ඇළි වැටි හා බේසම්
4. බිංදු, ඇළි වැටි හා විසිරි
5. බිංදු, ඇළි වැටි හා උප පෘෂ්ඨීය

18) එක්තරා බෝගයක දළ ජල සම්පාදන අවශ්‍යතාව දිනකට 20 mm හා ජල සම්පාදන කාර්යක්ෂමතාව 60% ක් නම් ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාව වනුයේ,

1. 6mm
2. 12mm
3. 18mm
4. 10mm
5. 40mm

19) කාර්යක්ෂමතාව අඩුම සාම්ප්‍රදායික ජල එසවුම් ක්‍රමයකි,

1. කප්පිය
2. දිය රෝදය
3. යොත්ත
4. ජල පොම්ප
5. ආඩියා ළිඳ

20) ඇළි සහ වැටි ජල සම්පාදනය යොදා ගැනීමේ වාසියකි,

1. ජල කාන්දුව වැඩි වැලි පස් සඳහා සුදුසු වීම.
2. වාෂ්පීකරණයෙන් වන ජල හානිය අඩුය.
3. පසට ඒකාකාරව ජලය ලබා දීම මගින් කම ගැඹුරකට පස තෙත් වීම.
4. පාංශු ඛාදනය අඩුය.
5. මුළු භූමියටම ජලය සැපයීමට හැකිවේ.

21) ගොඩබිම ඇති භෝගවල ප්‍රභාසංස්ලේෂණයේ සීමාකාරී සාධකය වනුයේ

1. සාන්ද්‍රණය
2. උෂ්ණත්වය
3. ආලෝකය
4. ජලය
5. නිෂේධක සහ දූෂක

22) උත්ස්වේදනය පාලනය කිරීමට යොදාගන්නා ශාක හෝර්මෝනයකි,

1. ඔක්සින
2. ගිබෙරලින්
3. සයිටොකයිනීන්
4. ඇබ්සිසික් අම්ලය
5. එතිලින්

23) අක්‍රීය අවශෝෂණය සිදුවන ප්‍රධාන ආකාරයක් නොවනුයේ,

1. මිසරණය
2. රසෝද්ගමනය
3. නිපානය
4. ආස්‍රැතිය
5. පහසුකම් සහිත විසරණය

24) ශාක පත්‍ර හරහා උත්ස්වේදන සිදුවන බව පරීක්ෂා කිරීමේදී භාවිත කරනු ලබන $CoCl_2$ කඩදාසි වල වර්ණ විපර්යාසය නිවැරදිව දැක්වෙනුයේ,

1. රෝස ⟶ නිල් 2. නිල් ⟶ රෝස 3. නිල් ⟶ රතු
4. දම් ⟶ අවර්ණ 5. නිල් ⟶ ගඩොල් රතු

25) පහත සඳහන් බෝගයන්හි සුප්තතාව ඇතිවීමට හේතුව නිවැරදි ආකාරයෙන් දක්වා නොමැත්තේ,

1. ලුනු මිදෙල්ල - ඝනකම් බීජාවරණය
2. සලාද බීජ - ආලෝක සංවේදී වීම
3. වී - අල්ප විකසිත කළලය
4. සියඹලා - දිලිසෙන බීජාවරණය
5. ගස්ලබු - වර්ධක නිශේධක ද්‍රව්‍ය

26) සහතික කළ බීජ වී නිෂ්පාදන වැඩපිළිවෙල යටතේ අත්තිවාරම් බීජ නිපදවන්නේ,

1. ලියාපදිංචි ගොවීන් විසින් පමණි
2. රජයේ වී ගොවිපොළවල පමණි.
3. රජයේ ගොවිපොළ හා ලියාපදිංචි පෞද්ගලික ගොවිපොළවල පමණි.
4. රජයේ ගොවිපොළ හා ලියාපදිංචි ගොවීන් විසින් පමණි.
5. ලියාපදිංචි ගොවීන් හා ලියපදිංචි පෞද්ගලික ගොවිපොළවල පමණි.

27) බිත්තර වී සඳහා බීජ සහතික කිරීමේ සේවයේ පර්යේෂණාගාර ප්‍රමිතීන් කිහිපයක් පහතින් දැක්වේ.

A – ප්‍රරෝහණ ප්‍රතිශතය >85%

B - වල් බීජ 5g / 500g

C - තෙතමනය < 13% උපරිම

මින් නිවැරදි ප්‍රමිතීන් වනුයේ,

1. A පමණි 2. B පමණි 3. A හා B පමණි 4. B හා C පමණි
5. A හා C පමණි

28) ශාක ජාන සම්පත් පරිබාහිර සංරක්ෂණ උදාහරණයක් වනුයේ,

1. රිටිගල රක්ෂිතය 2. යාල වනෝද්‍යානය 3. හග්ගල උද්භිද උද්‍යානය
4. හෝර්ටන් තැන්න

29) ත්‍රිගුණ ශාකවල,

1. විශාල බීජ සුළු ප්‍රමාණයක් හටගනී. 2. බීජ හට නොගනී.
3. කුඩා බීජ සුළු ප්‍රමාණයක් හට ගනී. 4. සරු බීජ හටගනී.
5. ඵල හට නොගනී.

30) ශාකයේ පැවැත්ම සඳහා බීජ වැදගත් වන්නේ,

A – ඒවායේ බහුගුණන හැකියාව නිසාය.

B - ඒවායේ ව්‍යාප්ත කිරීමේ හැකියාව නිසාය.

C - ඒවාට අහිතකර තත්ත්ව මගහැරීමට ඇති හැකියාව නිසාය.

මේ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය/ප්‍රකාශ වනුයේ,

1. A පමණි 2. B පමණි 3.C පමණි 4. A හා B පමණි

5. A, B සහ C සියල්ලම

31) පොලිතීන් ගෘහ තුළ දී ශාක අතු කැබලි වල මුල් ඇදීම වර්ධනය වනුයේ ප්‍රධාන වශයෙන්,

1. අර්ධ සෙවන තත්ත්වය සහ ඉහළ ආර්ද්‍රතාව නිසාය.
2. අර්ධ සෙවන තත්ත්වය සහ ප්‍රශස්ත මට්ටමක ඇති ආර්ද්‍රතාව නිසාය.
3. ඉහළ උෂ්ණත්වය සහ ඉහළ ආර්ද්‍රතාවය නිසාය.
4. ඉහළ උෂ්ණත්වය සහ අර්ධ සෙවන තත්ත්වය නිසාය.
5. ඉහළ උෂ්ණත්වය සහ අඩු ආර්ද්‍රතාවය නිසාය.

32) ක්ෂුද්‍ර ප්‍රචාරණය

1. අනෙකුත් ප්‍රකට ප්‍රචාරණ ක්‍රම වලට වඩා වියදම අඩුය.
2. දෛනික ක්ලෝන විචලතාව දක්වයි.
3. කුඩා බීජ සහිත බෝග ප්‍රචාරණය සඳහා වඩාත් සුදුසුය.
4. වෛරස් රහිත ශාක ජනනය කළ හැකිවේ.
5. සඳහා විශාල වශයෙන් ශ්‍රමය අවශ්‍ය වේ.

33) පළිබෝධ කළමනාකරණය පිළිබඳව වඩාත් නිවැරදි පිළිතුර වන්නේ,

1. විභව සමතුලිතතාවයේ පවත්වා ගනී.
2. ආර්ථික හානිය අවම මට්ටමක පවත්වාගනී.
3. පළිබෝධකයා ක්ෂේත්‍රයෙන් ඉවත් කරයි.
4. පළිබෝධකයා සම්පූර්ණයෙන් වර්ධනය කරයි.
5. පළිබෝධ ගහනය ආර්ථික දේහැලීය මට්ටමේ පවත්වා ගනී.

34) වල් පැළෑටි පිළිබඳව සාවද්‍ය ප්‍රකාශය වනුයේ,

1. පාංශු ඛාදනය අවම කිරීමට දායක වේ.
2. බෝග අස්වැන්නේ ගුණාත්මක බව අඩු වේ.
3. අහිතකර කාලහරණය කිරීමේ හැකියාව පවතී.
4. වල් පැළෑටි පාලනය සඳහා රසායනක ද්‍රව්‍ය භාවිතය ඉතා ජනප්‍රිය ක්‍රමයකි.
5. ජලය, ඉඩකඩ සහ ආලෝකය සඳහා පමණක් බෝගය සමඟ තරඟ කරයි.

35) ශාක රෝග හට ගැනීමට බලපාන හේතුව/ හේතු වන්නේ,

A – බැක්ටීරියාවන්

B – පයිටොප්ලාස්මා

C – නයිට්‍රජන් අධික වීම

D – උෂ්ණත්වය අඩු වීම

1. A පමණි 2. A හා B පමණි 3. A,B හා C පමණි

4. A,B හා D පමණි 5. A, B,C හා D සියල්ලම

36) රසායනික ස්වභාවය අනුව කෘමිනාශක වර්ග කරයි. පහත සඳහන් සංයෝග අතරින් ක්ෂීරපායී ධූලකතාවය අධික පළිබෝධනාශකය වන්නේ,

1. සෝඩියම් ආසනයිට් 2. කාබොෆියුරාන් 3. DDT 4. මැලතියන්

5. පයිරෙත්‍රින්

37) පළතුරු ඉදීමේ ක්‍රියාවලිය අනුව ආන්ත උපරිමය නොවන කාණ්ඩයට අයත් පළතුරක් නොවනුයේ,

1. ඩ්‍රැගන් ෆෘට් 2. මිදි 3. අඹ 4. අන්නාසි 5. චෙරි

38) පසු අස්වනු හානි අවම කිරීම සඳහා යොදාගත හැකි ක්‍රියාමාර්ග වනුයේ,

A – නියමිත පරිනත අවධියේ අස්වනු නෙලීම මගිනි.

B – අස්වනු තේරීම හා වර්ග කිරීම මගිනි.

C – සුදුසු ඇසුරුම් භාවිත කිරීම මගිනි.

D – නිසි කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිත කිරීම මගිනි.

E – සුදුසු ඇසුරුම් භාවිත කිරීම මගිනි.

1. A,B හා C ය 2. B,C හා D ය 3. A,B,C හා E ය

4. A,B,C හා D ය 5. A,C,D හා E ය

39) පළතුරු හා එළවළු පරිරක්ෂණයේදී, සුඛීකරණය සිදු කරනුයේ,

1. ස්වභාවික එන්සයිම අක්‍රිය කිරීමටය.

2. ද්‍රව්‍ය මෘදු කිරීමටය.

3. භෞතික හානි අවම කිරීමටය.

4. රසායනික ක්‍රියා උත්තේජ කිරීමටය.

5. ක්ෂුද්‍ර ජීවීන් අක්‍රීය කිරීමටය.

40) ළතුරු ජෑම් නිෂ්පාදන අයතනයක් සතු පුද්ගලයෙකු, අමුද්‍රව්‍ය වල සිට නිම් භාණ්ඩය සඳහා ඇති සියළුම ක්‍රියාවලි සෞඛ්‍යාරක්ෂිතව යහපත් තත්ත්වයෙන් නිෂ්පාදනය කරන බවට හා එය අඛණ්ඩව පවත්වාගෙන යන බවට ගත යුතු ප්‍රමිති සහතිකය වනුයේ,

1. GAP 2. ISO 3. HACCP 4. GMP 5. SLSI

41) දියර කිරි පරිරක්ෂණය සඳහා යොදා ගැනෙන උපරිතාප ක්‍රමයේදී (U.H.Y)

1. 100°C උෂ්ණත්වයේ විනාඩි 15 ක් තිබීමට සැලැස්වීම.
2. 121°C උෂ්ණත්වයේ විනාඩි 15 ක් තිබීමට සලස්වයි.
3. 140°C - 150°C උෂ්ණත්වයේ තත්පර කිහිපයක් තිබීමට සලස්වයි.
4. 72°C උෂ්ණත්වයේ තත්පර15 ක් තිබීමට සලස්වයි.
5. 63°C උෂ්ණත්වයේ විනාඩි 30 ක් තිබීමට සලස්වයි.

42) පරිසර උෂ්ණත්වය වැඩි වූ විට,

A – කිකිළියන්ගේ බිත්තර නිෂ්පාදනය අඩුවේ.

B – එළදෙනුන්ගේ ආහාර ආගනුම අඩුවේ.

C – කිකිළියන්ගේ ජල හා ආහාර ආගනුම වැඩිවේ.

D – එළදෙණුන්ගේ ජල ආගනුම අඩුවේ.

මින් සත්‍ය වන්නේ,

1. A හා B ය 2. A,B හා C ය 3. B,C හා D ය
4. A,B හා D ය 5. A, B,C හා D යන සියල්ලම

43) සත්ත්ව ආහාරයක ශක්ති පරපූරකයක් ලෙස යොදාගත හැකි ද්‍රව්‍යයකි.

1. සෝයා පුන්නක්කු 2. මස් අන්නය 3. පොල්තෙල්
4. සහල් නිවුඩු 5. පරිප්පු කුඩු

44) සයිලේජ් සෑදීම යනු,

1. වියළි ආකාරයෙන් තෘණ සංරක්ෂණය කරන ක්‍රමයකි.
2. තෙත් ආකාරයෙන් තෘණ සංරක්ෂණය කරන ක්‍රමයකි.
3. කෘතිම ද්‍රව්‍ය එකතු කිරීම මඟින් තෘණ සංරක්ෂණය කරන ක්‍රමයකි.
4. කිරි ගවයින් සඳහා පිළියෙල කරන විශේෂ ආහාරයකි.
5. ගව නෑම්බියන් සඳහා පිළියෙල කරන සමතුලිත ආහාරයකි.

45) ගවයාගේ ආහාර මාර්ගය පිළිබඳව අසත්‍ය ප්‍රකාශය වනුයේ,

1. ගවයාට කිරි දත් 20 ක් හා ස්ථිර දත් 32 ක් පවතී.
2. රූටනය, විතංශිකාව, බහුනැමිය හා ජඨරාශය සංකීර්ණ ආමාශයේ කොටස්ය.
3. කුඩා පැටවුන්ගේ සංකීර්ණ ආමාශයේ කොටස් අතරින් විශාලම වනුයේ විතංශිකාවය.
4. අන්නස්‍රෝතීය ඇලිය පිහිටනුයේ රූමනය හා විතංශිකාව අතරය.
5. කුඩා අන්ත්‍රය ජඨරාශයේ අපර කෙළවරින් ආරම්භ වේ.

46) සුදු පැහැති බිත්තර දමන කිකිළි වර්ගය වනුයේ,

1. ගෝල්ඩන් කොමට්, හයිසෙක්ස් බ්‍රවුන්, ලෝමාන්, ෂේවර් 579
2. කොබ්, හයිබ්‍රෝ, හයිසෙක්ස් වයිට්, ෂේවර් 288
3. ෂේවර් 288, හයිසෙක්ස් වයිට්, වයිට් ලෙගෝන්, හයිලයින් වයිට්
4. RIR, වයිට් ප්ලිමත් රොක්, ෂේවර් 579, හබර්ඩ්
5. ස්ටාබ්‍රෝ, ලෝමාන්, ගෝල්ඩන් කොමට්, ෂේවර් 579

47)බිත්තර රක්කවනය තුළ (Incubator) අවසන් වරට බිත්තර හැරවීම සිදුකළ යුතු වන්නේ,

1. දින 17 දීය. 2. දින 21 දීය. 3. දින 15 දීය.
4. දින 18 දීය. 5. දින 20 දීය.

48) කුකුළන්ට වැළඳෙන වෛරස් රෝග වනුයේ,

1. පුල්ලෝරම්, ගම්බෝරෝ, කුරුළු උණ, කකුල් කොරවීම
2. ගම්බෝරෝ, රැනිකට්, කුරුළු උණ, කුකුළු වසූරිය
3. කොක්සිඩියෝසිස්, කකුල් කොරවීම, කුරුළු උණ, පුල්ලෝරම්
4. කුරුළු උණ, පුල්ලෝරම්, කකුල් කොරවීම, තතුළු වසූරිය
5. ගම්බෝරෝ, රැනිකට්, පුල්ලෝරම්, කොක්සිඩියෝසිස්

49) එළදෙනකගේ කිරි එරීමට දායක වන ප්‍රධාන හෝමෝනය වනුයේ,

1. ටෙස්ටොස්ටරෝන් ය. 2. ප්‍රෝලැක්ටින් ය. 3. ඊස්ට්‍රජන් ය.
4. ඔක්සිටෝසින් ය. 5. ප්‍රොජෙස්ටරෝන්ය.

50) දෙනක් සිංචනය කිරීමට සුදුසු වේලාව වනුයේ,

1. මද චක්‍රයේ පළමු දින 2-3 අතර
2. මදය ආරම්භ වී පැය 12-18 ත් අතර
3. මදය ආරම්භ වී පැය 6-12 ත් අතර
4. මදය ආරම්භ වී පැය 16-20 ත් අතර
5. මද චක්‍රයේ දින 3-4 අතර